ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරු දරන සියලුම නිලධාරීන් සඳහා

**<u>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා දැනටමත් I ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන් අතරින් සුදුසු නිලධාරීන් පත්කිරීම</u>**

2023.10.11 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2023 හි අන්තර්කාලීන විධිවිධාන ප්‍රකාරව I ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරක් නොදරන I ශ්‍රේණියේ නිලධාරීන් අතුරින් සුදුසු නිලධාරීන් තෝරා පත්කර ගැනීමට අදාළ කටයුතු සිදුකරමින් පවතී.

02. ඒ අනුව I ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු සඳහා දැනටමත් I ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන් විසින් ඉල්ලුම් කරනු ලබන්නේ නම් ඒ සඳහා වන ඉල්ලීම් පහත ලේඛන ද සමඟ 2024.01.08 දිනට පෙර ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,නිදහස් චතුරස්‍රය, කොළඹ 07 ලිපිනයට යොමුකරන ලෙස දන්වමි.

I. නිලධාරියාගේ ඉල්ලීම් ලිපිය
II. ස්ථාන මාරු වීමට අපේක්ෂා කරන ආයතන ප්‍රධානියාගේ ඉල්ලීම
III. නිලධාරියා නිදහස් කිරීම සම්බන්ධ ආයතන ප්‍රධානියාගේ නිර්දේශ
IV. දැනට දරන I ශ්‍රේණියේ තනතුරට අදාල විධිමත් පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපත
V. EST 12 ආකෘති පත්‍රය

03. දැනටමත් I ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන් පමණක් මේ සඳහා අයදුම්කරන ලෙස දන්වන අතර 2024.01.08 දිනට පසුව ලැබෙන ඉල්ලීම් සම්බන්ධව කටයුතු කරනු නොලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

දිනය : 2023.12.17

කේ.ඩී.එන්.රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය